**අ.පො.ස.(උ.පෙළ) හැදෑරීමට ජනාධිපති අරමුදල මගින් පිරිනමන ශිෂ්‍යාත්ව සඳහා අයදුම්පත් කැඳවීම**

2015 වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට විභාගය සමත්ව 2018 වර්ෂයේදී අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත, ආර්ථික දුෂ්කරතා ඇති සිසුනට ශිෂ්‍යාත්ව පිරිනැමීමට අතිගරු ජනාධිපතිතුමා විසින් තීරණය කර ඇත. සුදුස්සන් තෝරා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- අයදුම් කිරීම සඳහා සුදුසුකම්

  (1) අයදුම්කරුවන්ගේ පවුලේ මාසික ආදායම රු:10,000/- නොඉක්මවිය යුතුය.

  (2) රජයේ පාසලක හෝ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසලක හෝ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක විය යුතුය.

  (3) අයදුම්කරු 2015 වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට අ.පො.ස.(උ.පෙළ) හැදෑරීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ලැබ සිටිය යුතුය.

  (4) අයදුම්කරු 5 වසර ශිෂ්‍යාත්වාධාරලාභියෙකු නොවිය යුතුය.

- එක් අධ්‍යාපන කලාපයකට පිරිනැමෙන ශිෂ්‍යාත්ව ප්‍රමාණය 100 කි. තෝරා ගන්නා ශිෂ්‍යාත්වලාභීනට අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින තෙක් මසකට රු: 500/- බැගින් මාස 24 ක උපරිම කාලසීමාවක් සඳහා ශිෂ්‍යාත්වාධාරයක් පිරිනමනු ලැබේ.

- අයදුම්කරුවන් පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගත් අයදුම්පත් සම්පූර්ණ කොට **තමා අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා අධ්‍යයන කටයුතුවල යෙදුනු පාසලේ විදුහල්පති වෙත පමණක් 2016.11.11 දින හෝ ඊට පෙර භාරදිය යුතුය.** විදුහල්පති විසින් අදාළ කටයුතුවලින් පසුව එම අයදුම්පත් **2016.11.25** දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද, අදාළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තම නිර්දේශයන් සහිත අයදුම්පත් **2016.12.16** දිනට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද භාරදීමට නියමිත බැවින් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- තෝරා ගන්නා සියලුම ශිෂ්‍යාත්වලාභීන්ට ලංකා බැංකු ශාඛාවක ගිණුමකට සෘජුවම වාරික මුදල් ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර ඇත.

- මේ සම්බන්ධව සම්පූර්ණ විස්තර සියලුම පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. ජනාධිපති අරමුදලේ **www.presidentsfund.gov.lk** ලිපිනයැති වෙබ් අඩවියෙන් ද විස්තර ලබාගත හැක.

**පී.බී. අබේකෝන්,**
**ජනාධිපති ලේකම්**

ජනාධිපති කාර්යාලය
කොළඹ - 01

2016 ඔක්තෝබර් මස වන දින

ආදර්ශ අයදුම්පත්‍රය

**2015 වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට විභාගය සමත්ව අ.පො.ස.(උ.පෙළ) හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනමන ශිෂ්‍යත්ව**

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර **සටහන** බලන්න.)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

පළාත : ...................................................
දිස්ත්‍රික්කය : ...................................................
අධ්‍යාපන කලාපය : ...................................................

**01.** අයදුම්කරු පිළිබඳ තොරතුරු

1. මුලකුරු සමඟ නම : ....................................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම: ....................................................................................
3. අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටි මාධ්‍යය : ..................................
   විභාග අංකය: ..................................
4. පෙනී සිටි පළමු අවස්ථාවේදීම අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් ලැබුවේද යන බව: ....................................................
5. අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා අධ්‍යාපනය ලද පාසල: ........................................
6. අ.පො.ස.(උ.පෙළ) හදාරන පාසල : ...............................................................
7. උපන් දිනය : .....................................................
8. පෞද්ගලික ලිපිනය : ....................................................................................
9. ඔබ 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්වාධාරලාභියෙක්ද? : ......................................

පවුල සම්බන්ධ තොරතුරු

| | | | ලකුණු |
|---|---|---|---|
| 1. | පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව | .................. | |
| 2. | ඔබ ශාරීරික දුබලතාවයකින් පෙළෙන්නේද? | ඔව්/නැත | |
| 3. | 2 ප්‍රශ්නයට පිළිතුර 'ඔව්' නම් ඒ දුබලතාවය කුමක්ද? | ................. | |
| 4. | ඔබගේ මව්පිය දෙදෙනාම ජීවත්ව සිටිත්ද? | ඔව්/නැත | |
| 5. | ඔබගේ මව හෝ පියා පමණක් ජීවත්ව සිටින්නේද? | ......... පමණක් සිටී. | |
| 6. | දෙමව්පියන් නොවන භාරකරුවකු යටතේ සිටින්නේද? (එසේ නම් නීත්‍යානුකූල භාරකාරත්වය සනාථ වන ලේඛනවල පිටපත් ඇමිණිය යුතුය.) | ඔව්/නැත | |

ලබාගෙන ඇති ලකුණු එකතුව

(උපරිම ලකුණු ප්‍රමාණය 25 කි.)

**02.** **<u>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ සාමාර්ථයන්</u>**

| විෂයය | ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|
| 1. ආගම | ………… | |
| 2. භාෂාව හා සාහිත්‍යය | ………… | |
| 3. ඉංග්‍රීසි භාෂාව | ………… | |
| 4. ගණිතය | ………… | |
| 5. ඉතිහාසය | ………… | |
| 6. විද්‍යාව | ………… | |
| 7. පළමු විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය……………………………………) | ………… | |
| 8. දෙවන විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය……………………………………) | ………… | |
| 9. තෙවන විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය……………………………………) | ………… | |
| ලබාගෙන ඇති ලකුණු එකතුව | ………… | |

(උපරිම ලකුණු ප්‍රමාණය 50 කි.)

**03.** **<u>විෂය සමගාමී ක්‍රියාකාරකම්</u>**

ක්‍රීඩා (උදාහරණ:අත්පන්දු / දැල්පන්දු / පාපන්දු / පැසිපන්දු /ක්‍රිකට් / එල්ලේ / බැඩ්මින්ටන් / කබඩි / රගර් / හොකී / මලල ක්‍රීඩා / චෙස් / කැරම් /ටෙනිස් / පිහිනුම් / ජිම්නාස්ටික් / කරාටේ / මේස පන්දු)

| ක්‍රීඩාව | ජාතික මට්ටමින් | | පළාත් මට්ටමින් | | කලාප මට්ටමින් | |
|---|---|---|---|---|---|---|
| | නායකත්වය/ 1 වන ස්ථානය | සහභාගිත්වය/ 2 හෝ 3 වන ස්ථානය | නායකත්වය/ 1 වන ස්ථානය | සහභාගිත්වය/ 2 හෝ 3 වන ස්ථානය | නායකත්වය/ 1 වන ස්ථානය | සහභාගිත්වය/ 2 හෝ 3 වන ස්ථානය |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |

ලබාගෙන ඇති ලකුණු එකතුව

(උපරිම ලකුණු ප්‍රමාණය 15 කි.)

<u>සෞන්දර්ය හෝ වෙනත් ක්‍රියාකාරකම්</u>

(උදාහරණ - විවාද/සංගීතය/ගායනය/චිත්‍ර/නැටුම්/බාලදක්ෂ/ශිෂ්‍ය භට)

| ක්‍රියාකාරකම් | ජාතික මට්ටමින් | | පළාත් මට්ටමින් | | කලාප මට්ටමින් | |
|---|---|---|---|---|---|---|
| | නායකත්වය / 1 වන ස්ථානය | සහභාගිත්වය / 2 හෝ 3 වන ස්ථානය | නායකත්වය / 1 වන ස්ථානය | සහභාගිත්වය/ 2 හෝ 3 වන ස්ථානය | නායකත්වය / 1 වන ස්ථානය | සහභාගිත්වය/ 2 හෝ 3 වන ස්ථානය |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |

ලබාගෙන ඇති ලකුණු එකතුව

(උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.)

<u>ලකුණු සාරාංශය</u> - පවුල සම්බන්ධ තොරතුරු

අ.පො.ස.(සා.පෙළ) විභාගය

විෂය සමගාමී - (ක්‍රීඩා)

විෂය සමගාමී - (සෞන්දර්ය හා වෙනත්)

ලබාගෙන ඇති මුළු ලකුණු ප්‍රමාණය

ඉහත දැක්වෙන කරුණු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. අවශ්‍ය අවස්ථාවකදී අදාළ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට මම එකඟ වෙමි.

……………………..
අයදුම්කරුගේ අත්සන

දිනය : 2016 ................ දින

---

විදුහල්පතිගේ සහතිකය

ඉහත කරුණු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

................................

විදුහල්පතිගේ අත්සන

දිනය : ...................

නිල මුද්‍රාව

සටහන: (1) අයදුම්කරුවන් අයදුම්පත් සම්පූර්ණ කොට **තමා අ.පො.ස.(සා.පෙළ) විභාගයට අධ්‍යයන කටයුතුවල යෙදුනු පාසලේ විදුහල්පති වෙත පමණක් 2016.11.11 දිනට හෝ ඊට පෙර භාරදිය යුතුය. ලකුණු ඇතුළත් කළයුතු කොටු අයදුම්කරු විසින් පිරවියයුතු නොවේ.**

(2) අදාළ ක්ෂේත්‍ර පිළිබඳව ලකුණු ලබාදීම විදුහල්පති විසින් ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ අභිමුඛයේදී කළයුතුය. ලකුණු දීම පිළිබඳ විස්තර විදුහල්පතිවරුන් වෙත ලැබී නොමැති නම්, විදුහල්පතිවරුන් විසින් ඒවා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් ලබාගත යුතුය.

(3) විදුහල්පති විසින් එම අයදුම්පත් **2016.11.25** දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද , කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා තම නිර්දේශයන් **2016.12.16** දිනට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද භාරදීමට නියමිත බැවින් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පවුලේ මාසික ආදායම පිළිබඳ ප්‍රකාශය :
(මව/පියා/භාරකරු විසින් සම්පූර්ණ කළයුතුය)
මම ................................................................................ රැකියාව කරමි./ රැකියාවක් නොකරමි. මගේ ස්වාමිපුරුෂයා / භාර්යාව.................................................................................... ආයතනයේ රැකියාව කරනු ලබයි. / රැකියාවක් කරනු නොලබයි. අප පවුලේ මාසික ආදායම රු: ................................. (අකුරෙන්) බව ද ප්‍රකාශ කරමි.

...........................................
මව/පියා/භාරකරුගේ අත්සන
දිනය: ..................... නම : .................................

ඉහත සඳහන් ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

....................................
ග්‍රාම නිලධාරිගේ අත්සන
දිනය: ...................... නිල මුද්‍රාව

ඉහත ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

..............................
ප්‍රාදේශීය ලේකම්
දිනය: ..................... නිල මුද්‍රාව

---

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
ඉදිරිපත් කරමි.

..............................
විදුහල්පතිගේ අත්සන
දිනය: ................... නිලමුද්‍රාව

---

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා
කලාපීය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ විස්තර -

| | නම | තනතුර | අත්සන |
|---|---|---|---|
| 1. | ................................................ | ............................. | .......................... |
| 2. | ................................................ | ............................. | .......................... |
| 3. | ................................................ | ............................. | .......................... |